(ආ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම් හා සම්බන්ධ නිශ්චිත වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන අවස්ථාවන්හිදී පමණක් අදළ පසු කාලීන වියදම් ප්‍රාග්ධනිත කෙරේ. අභ්‍යන්තරික වශයෙන් ජනනය වන කීර්ති නාමයට හා සන්නාමයට අදළ වියදම් ද ඇතුළු සෙසු සියලු වියදම්, ඒවා දරනු ලැබ ඇතැයි යනුවෙන් සලකා ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

(ඇ) විසුම් ගැන්වීම හා ව්‍යපහරණය

අස්පෘශ්‍ය වත්කම් ඒවා ව්‍යපහරණය කිරීම මත හෝ එහි භාවිතයෙන් පසුව ව්‍යපහරණය කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙතැයි අපේක්ෂා නොකරන විට අස්පෘශ්‍ය වත්කම් සේ හඳුනා නොගැනේ.

(ඈ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘශ්‍ය වත්කම්, ඒවා භාවිතය පිණිස පවත්නා දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ සරල මාර්ග රේඛීය ක්‍රමය අනුව ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. අලුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම මත දරන ලද පිරිවැය ක්‍රමක්ෂය කිරීම හෝ අයගත කිරීම සඳහා පහත දැක්වෙන නිර්ණායක මත පදනම්ව ප්‍රතිපත්තියක් සකසා ගන්නා ලදි.

වියදමේ /ආදයමේ ස්වභාවය	හිමිකාරිත්වය	පදනම	කාලසීමාව
අලුත්වැඩියා කිරීම	ස්වසන්තක	වසර 10 ක් පුරා දැරූ පිරිවැය ක්‍රමක්ෂය කිරීම	අවු.10
ඉදිකිරීම්	ස්වසන්තක	ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම හා සාමාන්‍ය ක්ෂය සිදු කෙරෙනුයේ 10% ක් වූ අනුපාතය මතය.	අවු. 20
	කල්බදු	ඉදිකිරීම්/ අලුත්වැඩියා කිරීමේ පිරිවැය කල්බදු කාල සීමාව හෝ වසර 10 ක් වූ කාල සීමාව යන දෙප්‍රමාණයෙන් අඩු කාල ප්‍රමාණය මත.	අවු.10
	පදිංචි	සන්තකව හෝ කල්බදු යටතේ හෝ නොමැත. ඉදිකිරීමේ හා අලුත්වැඩියා කිරීමේ වියදම් වසර 10 ක් මුළුල්ලේ ප්‍රාග්ධනිත කිරීම	අවු.10
ලද ප්‍රදාන		අලුත්වැඩියා කිරීම් හා ඉදිකිරීම් සඳහා ලද ප්‍රදන වසර 10 ක් මුළුල්ලේ ක්‍රමක්ෂය කිරීම.	අවු. 10

(අ) වන වගුව

අලුත්වැඩියා කිරීමේ වියදම් හා ඉදිකිරීමේ වියදම් ක්‍රමක්ෂය කිරීම

වැඩ බිම	වර්ෂය	වියදමෙහි ස්වභාවය	පිරිවැය (රු.)	ක්‍රමක්ෂය නොකළ ශේෂය ඉ/ගෙ 2014-01-01	පදනම	ක්‍රමක්ෂය ගාස්තු	ක්‍රමක්ෂය නොකළ ශේෂය ඉ/ගෙ
කෞතුකාගාරය	2013	ඉදිකිරීම්	172,847,765.42	155,468,924.12			
	2014		1,881,295.16				
	2015		389,177.00				
එකතුව			**175,118,237.58**		5%	8,755,911.88	**146,713,012.24**
බත්තරමුල්ල	2013	ඉදිකිරීම්	117,704,905.75	105,578,426.58			
	2014		7,119,771.92				
	2015		9,744,207.82				
එකතුව			**134,568,885.49**		5%	6,728,444.27	**98,849,982.31**
පින්නවල	2013	අලුත්වැඩියා කිරීම්	10,086,000.00	8,068,800.00			
එකතුව			**10,086,000.00**		10%	1,008,600.00	**7,060,200.00**
වාගොල්ල		අලුත්වැඩියා කිරීම්		**729,439.02**			
	2014		810,487.80				
එකතුව			**810,487.80**		10%	81,048.78	**648,390.24**
පේරාදෙනිය	2013	අලුත්වැඩියා කිරීම්	31,657,966.00	24,429,537.48			
	2014		8,968,353.20				
	2015		677,220.25				
එකතුව			**41,303,539.45**		10%	4,130,353.95	**20,299,183.54**
වැලිපැන්න	2013	අලුත්වැඩියා කිරීම්	10,269,019.54	8,215,214.00			
	2014						
එකතුව			**10,269,019.54**		10%	1,026,901.95	**7,188,312.05**
තුරඟතරඟ පිටිය	2013	අලුත්වැඩියා කිරීම්	1,113,613.46	890,889.80			
	2014						
එකතුව			**1,113,613.46**		10%	111,361.35	**779,528.45**
කටුනායක	2013	අලුත්වැඩියා කිරීම්	1,060,000.00	848,000.00			
	2014						
එකතුව			**1,060,000.00**		10%	106,000.00	**742,000.00**
උණවටුන	2013	අලුත්වැඩියා කිරීම්	1,000,000.00	800,000.00			
	2014						
එකතුව			**1,000,000.00**		10%	100,000.00	**700,000.00**
කේ සෝන්	2013	අලුත්වැඩියා කිරීම්	8,353,071.63	6,682,457.31			
					10%	835,307.16	**5,847,150.15**
තුම්මුල්ල	2015	අලුත්වැඩියා කිරීම්	769,766.50				
එකතුව			**769,766.50**		10%	76,976.65	**692,789.85**
			376,099,549.82			22,960,905.99	289,520,548.82
අපේ ගම		ඉදිකිරීම්					
	2014		20,708,451.19	**19,673,028.63**			
	2015		4,468,931.45				
එකතුව			**25,177,382.64**		5%	1,258,869.13	**18,414,159.50**
			401,276,932.46			24,219,775.12	307,934,708.32

2.4.5 අබලතා

මණ්ඩලය සතු වත්කම්හි ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණ, කිසියම් වත්කමක අබලතා ලක්ෂණ පෙන්වන්නේදැයි නිශ්චය කරනු පිණිස එක් එක් ශේෂ පත්‍ර දිනයේදී සමාලෝචනයට හසු කෙරේ. එවැනි අබලතා ලක්ෂණ විද්‍යාමාන වන්නේ නම්, අදාළ වත්කමෙහි ආපසු අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. යම් අබලතා අලාභයක් හඳුනා ගැනෙනුයේ, කිසියම් වත්කමක ධාරණ අගය හෝ එහි මුදල් උත්පාදන ඒකකය ආපසු අයකරගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවකදී ය. අබලතා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

2.4.6 වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ උපලබ්ධි විය යුතු ඇස්තමේන්තුගත වටිනාකම යටතේ සඳහන් කරනු ලැබේ. බොල් ණය සහ අඩමාන ණය සඳහා මූල්‍ය ප්‍රකාශයේ ප්‍රතිපාදන සලසා ඇත.

2.4.7 භාණ්ඩ වට්ටෝරු

අභාවිත සහ අලුත්වැඩියා කළ හැකි අයිතමයන් සඳහා ප්‍රතිපාදන සැලැස්වීමෙන් පසුව, භාණ්ඩ ලැයිස්තු පිරිවැයෙහි අවම මිලට සහ ශුද්ධ උපලබ්ධි අගයට අගය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය වන්නේ සාමාන්‍ය ව්‍යාපාරික කාලය තුළ බඩු ලැයිස්තු විකිණිය හැකි මිල වන අතර හානියට පත් තොග සහ අලුත්වැඩියා තොග, තොග උපලේඛනය යටතේ දැක්වේ.

අලුත්වැඩියා කළ හැකි හා විකිණිය නොහැකි භාණ්ඩ විමසිලිමත්ව හඳුනා ගැනීම හානියට පත් තොග විෂයයෙහි අවශ්‍ය වන්නා වූ කාරණයකි. මෙම කාර්යය සඳහා කමිටුවක් පත්කර ඇත. විකිණිය නොහැකි භාණ්ඩ වෙන්කර හඳුනා ගනු ලැබ හානියට පත් තොගවල වටිනාකම නිශ්චය කරනු ලබන තෙක් හානියට පත් තොග සඳහන් කරනුයේ ඒවා ගත් මිලටය.
වසර තුළ මෙහෙයවනු ලබන කලා හා අත්කම් භාණ්ඩ සහ ත්‍යාග භාණ්ඩ විශාල ප්‍රමාණය හේතුවෙන් හානියට පත්වීම් හෝ හිඟහිටීම් සිදු නොවේ යැයි කිව නොහැකිය. ඒ අනුව, භාණ්ඩ හානියට පත්වීම් හා හිඟහිටීම් මත සිදුවන අලාභ අවමකර ගනු පිණිස විකිණිය හැකි තොග ප්‍රමාණයෙන් ඉඩදිය හැකි හානිවීම් හා හිඟහිටීම්වල පරිමාව තීරණය කිරීම අරබයා ප්‍රතිපත්තියක් සකසනු ලැබ තිබේ. ඒ අනුව, හානිවීම් හා හිඟහිටීම් නිසා උද්ගතවන අවිනිශ්චිතතා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස තොග ප්‍රමාණයෙහි වටිනාකම මත පදනම්ව ඒ සඳහා වූ ප්‍රතිපාදනයක් ඇති කෙරේ.

2.4.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් වටිනාකම දැනගැනීමට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන අත ඉතිරි මුදල් හා මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කෙරේ. මුදල් හා මුදල් සමාන දෑ යන්නෙහි අත ඉතිරි මුදල් සහ බැංකු අයිරා හැර වෙනත් මුදල්, කෙටි කාලීන ණය ගැනුම් හා කෙටිකාලීන ආයෝජන අන්තර්ගත වේ.

2.4.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLPSAS 02 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත.

2.4.10 සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් සඳහා වන බැඳියාව සංවිධානයේ සේවා නියුක්තයන් 188 දෙනෙකු ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. මෙම බැඳියාව සපුරාලීම පිණිස පළමු සේවා වර්ෂයේ සිට ආරම්භවන එක් එක් සම්පූර්ණ සේවා වර්ෂය සඳහා සියළුම සේවා නියුක්තයන්ගේ මූල්‍ය වර්ෂයේ අවසන් මස අර්ධ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන ලද වටිනාකමට සමාන අගයකට ශේෂ පත්‍රයේ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂය ආරම්භයේදී ඉදිරියට රැගෙන ආ ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේ ඉදිරියට රැගෙන ගිය ප්‍රතිපාදන අතර ඇතිවන වෙනසෙහි අඩුව සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශයේදී කටයුතු කරනු ලැබේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම

සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවා නියුක්තිකයන් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා සුදුසුකම් ලබයි. සේවා නියුක්තිකයින්ගේ දළ පඩිනඩි මත 12% ක් හා මණ්ඩලය විසින් 3% ක් වන පරිදි පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ලබා දේ.

2.4.11 ණය දිගු කාලීන / කෙටි කාලීන

(අ) ලංකා බැංකුව රු.මි. 495

සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීම සඳහා චක්‍රීය බැර පදනමක් මත රු.මි. 100 ක ණය පහසුකමක් හා ඉදිකිරීම් වියදම් හා සැපයුම්කරුවන්ගේ ගෙවීම් සපුරා ගැනීම සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මත මූල්‍යයනය සලසනු පිණිස රු.මි.300 ක ණය පහසුකමක් ලක්සල සතු රු.මි. 497 ක් වටිනා කොළඹ කොටුවේ පිහිටි ගොඩනැගිල්ල උකස්කර ලංකා බැංකුව වෙතින් ලබාගෙන ඇත.

(ආ) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රු.මි. 210

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කැළණිය ශාඛාව වෙතින් රු.මි. 200 ක ණය මුදලක් ලබාගෙන ඇත. මේ වෙනුවෙන් වූ ණය පහසුකම මහ භාණ්ඩාගාරය විසින් පිළියෙල කරන ලද හෙයින් අප විසින් කිසිදු ඇපකරයක් පිරිනමනු ලැබීම අවශ්‍ය වූයේ නැත.

2.4.12 බැරකම් හා ප්‍රතිපාදන

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස නෛතික /සම්ප්‍රයුක්ත බැඳීමක් වර්තමානයේ පවතින විට බැරකම් හා ප්‍රතිපාදන ශේෂ පත්‍රය තුළ හඳුනා ගැනේ. එකී බැඳීම්වල නිරවුල් කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් විගලනයක් උද්ගත වෙතැයි අපේක්ෂා කෙරේ. ණය හිමියා විසින් කරනු ලබන ඉල්ලීමකදී හෝ ශේෂ පත්‍රයේ දිනට වසරක් ඇතුළත දී හෝ ගෙවිය යුතු වන්නාවූ බැඳීම් ශේෂ පත්‍රය තුළ ප්‍රවර්තන බැරකම් ලෙස සලකනු ලැබේ. ශේෂ පත්‍රයේ දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ශේෂ පත්‍රය තුළ ප්‍රවර්තන නොවන බැරකම් ලෙස සැලකේ.

(අ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ඒවායේ පිරිවැය අගය මත දක්වා ඇත.

2.4.13 ආදායම හඳුනා ගැනීම

* **භාණ්ඩ විකුණුම්**

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම, ලද හෝ ලැබිය යුතු ශුද්ධ ප්‍රතිලාභ, වෙළඳ වට්ටම් සහ ධාරිතා ප්‍රතිදාන ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ. සුවිශේෂී අවදානම් සහ හිමිකාරිත්ව ප්‍රතිලාභ මිලදී ගන්නා වෙත පවරනු ලැබ ඇති විට, ප්‍රතිෂ්ඨාව අයකර ගැනීම සිදුවිය හැකි විට, ආශ්‍රිත පිරිවැය සහ සිදුවිය හැකි භාණ්ඩ ආපසු පැමිණීම් වාර්තා විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු ගත කළ හැකි අවස්ථාවක සහ භාණ්ඩ සම්බන්ධයෙන් අඛණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් නොමැති විට ආදායම හඳුනා ගනී. අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම විකුණුම් කොන්ත්‍රාත්තුවේ එක් එක් කොන්දේසි මත රඳා පවතිමින් වෙනස් වේ.

වෙනත් මෙහෙයුම් ආදායම්

(අ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් උද්ගත වන ලාභ හා අලාභ

දේපළ, පිරියත හා උපකරණ විසුම් ගැන්වීම හෝ ව්‍යපහරණය කිරීම මත උද්ගතවන යම් ලාභ හෝ අලාභ අදළ විකුණුම් සිදුවන කාල පරිච්ඡේදය තුළ හඳුනා ගනු ලබන අතර වෙනත් මෙහෙයුම් ආදයම් ලෙස වර්ගීකරණය කෙරේ.

ලද ප්‍රාග්ධන ප්‍රදාන

ලද ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදයම් ලෙස හඳුනා ගනු ලැබ ඇති අතර වසර 10 ක කාල පරිච්ඡේදයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කර ඇත.

2012 වසර තුළ කෞතුකාගාර පරිශ්‍රයේ පිහිටි අලෙවි සංකීර්ණය ප්‍රතිනිර්මාණය කර නවීකරණය කිරීම සඳහා ''දිවි නැගුම'' වැඩ සටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් රු. 100,000,000/ ක් වූ මුදලක්ද, 2013 වසර තුළ ජාතික අයවැය යෝජනා යටතේ මහ භාණ්ඩාගාරය වෙතින් රු. 107,262,625/ ක්වූ මුදලක් ද, 2014 දී තවත් රු. 46,137,374 ක මුදල් ප්‍රමාණයක් ද ලැබුණි.

සමාලෝචනයට හසු වන කාල පරිච්ඡේදය තුළ ලත් ප්‍රදාන පහත දැක්වෙන පරිදි ගිණුම් ගතකර ඇත.

ලද ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

ලැබුනේ කාගෙන්ද යන වග	වර්ෂය	ලද ප්‍රදානය	2015.1.1 දිනට ක්‍රමක්ෂිත මුදල	2015 සඳහා ආදයම	ක්‍රමක්ෂය නොකළ ශේෂය ඉ/ගෙ
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	2012	100,000,000	70,000,000	10,000,000	60,000,000
අයවැය ප්‍රතිපාදන	2013	36,000,000	28,800,000	3,600,000	25,200,000
අයවැය ප්‍රතිපාදන	2013	10,224,643	8,179,714	1,022,464	7,157,250
අයවැය ප්‍රතිපාදන	2013	42,109,637	37,898,673	4,210,964	33,687,709
අයවැය ප්‍රතිපාදන	2013	11,099,920	8,879,936	1,109,992	7,769,944
අයවැය ප්‍රතිපාදන	2013	7,828,426	6,262,741	782,843	5,479,898
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	2014	35,000,000	31,500,000	3,500,000	28,000,000
අයවැය ප්‍රතිපාදන	2014	11,137,374	10,023,637	1,113,737	8,909,900
		253,400,000	**201,544,701**	**25,340,000**	**176,204,701**

2.4.14 වියදම් හඳුනා ගැනීම

(අ) අයභාර වියදම්

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් උපයනු ලබන ලාභය වනුයේ, සියලු දන්නා බැරකම් සඳහා සහ දේපළ, පිරියත හා උපකරණ එල්ලේ ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව ඉතිරිවන මුදලයි.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රියාකාරිත්ව ක්‍රමය,ව්‍යවසායීය කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ අයුරින් ඉදිරිපත් කරන්නේය යන්නත්, ඒ අනුව මෙම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරන්නේය යන්නත් මණ්ඩලය දරන මතයයි.

(ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපයීමේ ධාරිතාව ඉහළ නැංවීම උදෙසා ස්ථාවර ස්වරූපයක් ගත් වත්කම් පුළුල් කිරීමේ හෝ වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබ ඇත. දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණය මත උද්ගතවන ආදායම් ස්වරූපයේ ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ගණනය කරනු ලැබ ඇත.

(ඇ) විලම්බිත අයභාර වියදම්

(1) **අලෙවිසැල් නැවත දියත් කිරීමේ වියදම් ක්‍රමක්ෂය කිරීම**

අලෙවිසැල් නවීකරණය කර ඊට අදාළ ඉදිකිරීම් වලින් පසුව ඒවා නැවත දියත් කිරීමේ කාර්යයන්හිදී ඊට අන්තර්ගත විවිධ වියදම් විෂයාංග කරණකොට ගෙන විශාල ප්‍රමාණයේ මූල්‍ය පිරිවැයක් දැරීමට සිදුවී ඇත. තවද සැලකිය යුතු වියදමක් දරා අලුතින් ඉදිකළ අලෙවි සැල් ද ආරම්භ කරනු ලැබ තිබේ. සමාලෝචිත වසර තුළ අලෙවි සැල් 5 ක් එසේ දියත් කර හැර ඇති අතර ඊට දරන ලද වියදම රු. 19,057,882/ ක් වූයේය. මෙම වියදම වසර තුනක කාල පරිච්ඡේදයක් මුළුල්ලේ මූල්‍ය ප්‍රකාශ තුළ ක්‍රමක්ෂය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ක්‍රමක්ෂය නොකළ ශේෂ මුදල ආදායම් ප්‍රකාශ තුළ විලම්බිත අයභාර වියදම් ලෙස හඳුනා ගෙන ඇත.

ස්ථානය	පිරිවැය (රු.)	ඉකුත් වසරේ අයකිරීම (රු.)	3/3 වසර සඳහා අයකිරීම (රු.)	විලම්බිත අයභාර වියදම (රු.)
කෞතුකාගාරය	10,423,953	6,949,302	3,474,651	-
බත්තරමුල්ල	6,795,454	4,530,303	2,265,151	-
ගාල්ල	1,241,170	827,447	413,723	-
පේරාදෙනිය	297,305	198,203	99,102	-
වැලිපැන්න	300,000	200,000	100,000	-
	19,057,882	12,705,255	6,352,627	-
පින්නවල (2014 සෘජු අයකිරීම)	-	130,453	-	-
	19,057,882	12,835,708	6,352,627	-

(2) **ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය මත දරන ලද පිරිවැය**

මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදමයේ කොටසක් ලෙස සමාලෝචිත වසර තුළ“PED 10” යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාමයාම සඳහා සේවක සේවිකාවන් 20 දෙනෙකු සිය මනාපය ප්‍රකාශ කරන ලද අතර ඒ සඳහා රු.10,432,332.25 ක මුදලක් වැයවී ඇත. මෙම පිරිවැය ශේෂ සේවා කාලය තුළ විහිදුවා හැරීම සඳහා වූ ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කෙරිණි. ඒ අනුව, එක් එක් සේවකයා වෙනුවෙන් දරන ලද වියදම සමාන පදනමක් මත ඔවුන්ගේ ශේෂ සේවා කාලය තුළ විහිදුවා හැරේ. ක්‍රමක්ෂිත නොකළ ශේෂය විලම්බිත අයභාර වියදම් ලෙස පවතී. ක්‍රමක්ෂය කෙරුණු මුදල් ප්‍රමාණය සහ ක්‍රමක්ෂය නොකෙරුණු ශේෂ මුදල් ප්‍රමාණය පහත දක්වා ඇති පරිදි සමන්විත වේ.

	රු.
දරන ලද මුළු පිරිවැය	10,432,332
අඩු කළා : ඉකුත් වසර තුළ ක්‍රමක්ෂිත මුදල(2013.12.31 දිනට)	10,432,332
2014.01.01 දිනට ආරම්භක ශේෂය	-
අඩු කළා : වසර තුළ ක්‍රමක්ෂිත මුදල	-
	-

2.4.15 බදුකරණය

ආදායම් බදු වියදම්

වර්ෂයේ ආදායම් බදු වියදම් ප්‍රවර්තන හා විලම්බිත බදු වලින් සමන්විත වේ. කොටස් ආයෝජනය කළ සෘජුවම හඳුනා ගනු ලබන විෂයාංගවලට ආදයම් බදු අදළ වනතාක් දුරට ඒවා ආදයම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. එබඳු අවස්ථාවකදී ආදයම් බදු වියදම් හඳුනා ගැනෙනුයේ කොටස් ආයෝජනය තුළය.

2.4.16 ණය ගැනුම් පිරිවැය

ණය මුදල් ගැනුම් පිරිවැය ඒවා දරනු ලබන වර්ෂයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

2.4.17 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කෙරෙනු පිණිස අවශ්‍ය අවස්ථාවන්හිදී තොරතුරු යළි වර්ගීකරණයට හසුකර ඇත.

2.4.18 බැඳීම් සහ අවිනිශ්චිතතා

මණ්ඩලයේ පාලනයෙන් පරිබාහිර අතීත සිදුවීමක් හේතුවෙන් උද්ගතවන්නාවූ සහ අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් ස්ථිර වන්නා වූ විභව්‍ය වත්කම් හා බැඳීම් අවිනිශ්චිතතා වන්නේය.

2.4.19 ශේෂ පත්‍රයේ දිනට පසුව පැන නගින සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් අනතුරුව උද්ගත වන සියලුම සැලකිය යුතු සිදුවීම්, ඒවා අදාළ වන අවස්ථාවේදී හෙළිදරව් කර ගළපා ඇතැයි යනුවෙන් සලකා ඇත.

2.5 අත්කම් පුහුණු අංශය

2008.12.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2009 සිට ක්‍රියාත්මක වන පරිදි අත්කම් පුහුණු අංශය එහි කටයුතු අවසන් කර ඊට අයත් සියලුම කාර්ය මණ්ඩල ස්ථාන මාරු කර යවා ඊට අයත්ව තිබූ භෞතික වත්කම් සියල්ලම පාහේ ජාතික කර්මාන්ත සභාව වෙත භාරදෙනු ලැබ වසා දමා ඇත.

කෙසේ වුවද, එදිනට ගිණුම් පොත්වල පැවති ශේෂ ඉවත්කර හෝ පවරා දෙනු ලැබ හෝ නොමැති අතර ඒවා මේ දක්වා බේරුම් නොකර පවතී. විධිමත් අනුමැතිය ලබාගන්නා තෙක් සහ වෙනම ව්‍යාපාරයක් ලෙස එලෙස ශේෂව පවත්නා මුදල් ප්‍රමාණ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කරන තෙක්, මහ භාණ්ඩාගාරයේ ද අනුමැතිය ඇතිව ඒවා බේරුම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැන් ගනු ලැබ ඇත. මෙම විෂයාංගවලට අදාළ සංසන්දනාත්මක සංඛ්‍යා ඒ අනුව ගළපා ඇත. කරුණාකර අත්කම් පුහුණු අංශය සඳහා වන පිටුව බලන්න.

අත්කම් පුහුණු අංශය තුළ නිරාකරණය නොවී පවත්නා ශේෂ මහ භාණ්ඩාගාරයේ අනුමැතිය අපේක්ෂාවෙන් වෙන් වශයෙන් හෙළිදරව් කර ඇත. මෙම විෂයාංගවලට අදාළ සංඛ්‍යා ඒ අනුව ගළපනු ලැබ තිබේ.

2.6 අපේ ගම

අපේ ගම ව්‍යාපෘතියට අයත් කටයුතු අංක 1933/13 දරන රජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව 2015 වසර අවසානයේදී අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දෙන ලදි. අපේ ගම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම අධ්‍යපන අමාත්‍යාංශයෙන් අයකර ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබ තිබේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය ව්‍යාපෘති
2015 දෙසැම්බර් මස 31 දිනට අවසන් වර්ෂය

	රු.
වත්කම්	
දේපළ, පිරියත හා උපකරණ	**46,298,422**
	46,298,422
ජංගම නොවන වත්කම්	
භාණ්ඩ වට්ටෝරු	
වෙළඳ ණයගැතියෝ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	**31,140,299**
මුදල් හා මුදල් සමාන දෑ	**31,177**
ජංගම වත්කම්	**31,171,476**
	77,469,898
මුළු වත්කම්	
කොටස් හිමිකම් හා බැරකම්	
ප්‍රාග්ධනය හා සංචිත	
ප්‍රකාශිත ප්‍රාග්ධනය	
ප්‍රාග්ධන සංචිත	**814,419**
ප්‍රත්‍යාගණන සංචිත	**9,086,454**
ලැබී ඇති ප්‍රදාන	**55,336,829**
ලාභ සහ අලාභ	**(17,524,970)**
	47,712,732
මුළු ප්‍රාග්ධනය හා සංචිත	
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	
විලම්බිත බදු බැරකම්	**12,345,384**
විලම්බිත ආදායම	
ණය	
	12,345,384
ජංගම නොවන බැරකම්	
ණය හිමියෝ සහ උපචිත	**14,475,754**
බැංකු අයිරාව	**2,936,028**
	17,411,782
ජංගම බැරකම්	
	77,469,898
මුළු කොටස් හිමිකම් සහ බැරකම්	

මෙම මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල නියමයන් හා අනුකූල වේ.

....

ඊ.ඒ. ඩේලිකන් මහතා

මූල්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්/ඒ/එස්එල්එච්බී/1/03/2015/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 මැයි 16 දින

CIA / FNA P1

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :-
1. ලේකම් - කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටිසිඑම්/ඒ/එස්එල්එච්බී/1/03/2015/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 මැයි 16 දින

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 64(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 පෙබරවාරි 20 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

(i) මෙහෙයුම් කටයුතුවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය තුළ ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය එකතුව රු.2,715,230 ක් අඩුවෙන් ගලපා තිබුණි.

(ii) ශේෂ පත්‍රයේ දිගුකාලීන වගකීම් යටතේ දක්වා තිබුණු විලම්භිත ආදායම රු.25,339,988 කින් අඩු වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි ඡේද අංක 73 (ඊ) ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ වෙනම සටහනක් මගින් හෙළිදරව් කළ යුතු වුවත්, "අපේ ගම" ව්‍යාපෘතියට අයත් රු.30,580,126 ක ස්ථාවර වත්කම් සහ කටුබැද්ද ව්‍යාපෘති අංශයේ රු.63,037,977 ක ස්ථාවර වත්කම් සඳහා වූ විස්තර සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව මණ්ඩලයේ පාරිතෝෂික වෙන්කිරීම් පිළිබඳව සටහනක් මගින් විස්තරාත්මක පැහැදිලි කිරීම් ඉදිරිපත් කළ යුතු වුවත්, වර්ෂයේ ආරම්භක ශේෂ, සමාලෝචිත වර්ෂයේ වෙන් කිරීම්, වර්ෂය තුළ ගෙවීම් හා අවසන් ශේෂය ඇතුළත් විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අලෙවිසැල් 04 ක් මගින් විකුණුම් වටිනාකම රු.2,335,703 ක් වූ භාණ්ඩ සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස විවිධ පාර්ශවයන්ට ලබාදී තිබුණද එම භාණ්ඩ ගිණුම්ගත කිරීම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) මණ්ඩලය ගිණුම් පිළියෙල කරනු ලබන පරිගණක මෘදුකාංගය වන System Applications & Products (SAP) අනුව 2015 ජනවාරි 31 දිනට රු.781,552,673 ක් වූ විකුණුම් වටිනාකම සහ අලෙවි කටයුතු සඳහා යොදා ගනු ලබන පරිගණක මෘදුකාංගය වන Point of Sales (POS) අනුව විකුණුම් වටිනාකම රු.789,905,614 ක් වූයෙන් වෙනස රු.8,352,941 ක් විය. එම වෙනසින් රු.6,773,995 ක් අවිධිමත් ජර්නල් සටහනක් මගින් විකුණුම් ගිණුම බැර කර තොග අඩුවීම් (Negative Inventory) ලෙස තොගයට හර කර තිබූ අතර රු. 1,578,946 ක් වූ ඉතිරි වෙනස ගිණුම්ගත කළ බවට සාක්ෂි නොවීය.

(ඇ) විවිධ වෙළඳ නොවන මිලදී ගැනීම් සඳහා ලබාදී තිබුණු එකතුව රු.8,713,574 ක් වූ, විවිධ අත්තිකාරම් පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් අදාළ වියදම් හෝ වත්කම් ගිණුම්වලට ගළපා නොතිබීම නිසා වියදම් හා වත්කම් අඩුවෙන්ද, ලාභය වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඈ) තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව වර්ෂ අවසාන දිනට ගළපන ලද ද්‍රව්‍ය තොගයේ පිරිවැය රු.396,229,215 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වෙළඳ භාණ්ඩ තොගයේ පිරිවැය රු.534,591,366 ක් ලෙස එනම්, රු.138,362,151 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මණ්ඩලයේ තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව වර්ෂය අවසාන දිනට පළුදු වූ සහ තොග ඌනතාවය පිරිවැයට රු.25,549,835 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.12,328,247 ක් ලෙස තොගයට ගැලපීම් කිරීම නිසා එකතුව රු.13,221,588 ක හානි වූ තොග සහ තොග ඌනතාවයන් පිළිබඳව අවශ්‍ය ගැළපීම් සිදු කර නොතිබුණි. ඒ අනුව තොග ඌනතාවය අඩුවෙන් ගැලපීම් නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ අලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2008 වර්ෂයේ සිට ගෙවිය යුතු බදු බැරකම් යටතේ දැක්විය යුතු රු.42,901,745 ක මුදල 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්භිත බදු යටතේ දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම් වර්ග 03 ක ශේෂය හා ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම ශේෂ සැසඳීමේදී එකතුව රු.1,345,747 ක වෙනස්කම් පැවතුණි.

(ආ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ණය ශේෂ සනාථන ලිපිය අනුව 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ණය ශේෂය රු.4,767,000 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම ණය ශේෂය රු.3,064,500 ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් රු.1,702,500 ක වෙනසක් විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(අ)

විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
	රු.	
ඉඩම් හා ගොඩනැගිලි	655,850,917	ස්ථාවර වත්කම් ලේඛන
ප්‍රාදේශීය සංවර්ධන බැංකු ණය	200,000,000	ණය ගිවිසුම් හා ණය ලබා ගැනීමට අදාළ ලිපිගොණු
බැංකු ජංගම ගිණුම් - 04	1,042,715	2015 වර්ෂයේ බැංකු ප්‍රකාශන සහ බැංකු සැසඳුම් වාර්තා
කොටුව ලක්සල නවීකරණය	43,751,410	ගොඩනැගිල්ල නවීකරණයට අදාළව ක්‍රමවත්ව නඩත්තු කළ ලිපිගොනු හා ලේඛනවල මුල් පිටපත්
පරිගණක හා උපාංග	29,112,879	පරිගණක හා උපාංග පිළිබඳ ලේඛනය
ප්‍රදර්ශන භාණ්ඩ	4,984,780	භෞතික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා
වෙළඳ භාණ්ඩ තොගය	17,815,115	භෞතික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා
අනෙකුත් ආදායම්	10,399,200	ලෙජර් ගිණුම්
කෙටිකාලීන බැංකු ණය	110,177,581	ණය ලබා ගැනීම්, ගෙවීම් පිළිබඳ ලේඛන

5

ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	477.936	ගෙවීම් වවුචර් පත් අංක. චෙක්පත් අංක සහ ප්‍රතිවිරුද්ධ ලෙජර් ගිණුමේ සංකේත අංකය
අනුග්‍රාහක වියදම්	1,187,175	ගෙවීම් වවුචර්, ගෙවීම් විස්තර සහිත ලිපිගොණු
ඇන්වනා කුළුණු ඉදිනොකිරීම වෙනුවෙන් වන්දි ගෙවීම්	2,000,000	මෙම වටිනාකම කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමකින් තොරව, අවිධිමත් ජර්නල් සටහනක් භාවිතා කර වෙනත් ආදායම් ගිණුම බැර කර තිබුණ ද හර සටහන ගිණුම්ගත කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොවිය.
ණයහිමි සහ පාරිතෝෂික වැය ගිණුම	600,000	අදාළ ජර්නල් සටහන සහ පැහැදිලි කිරීම.

(ආ) ස්වර්ණ වර්ණ සම්මාන උත්සවයට ආහාර සැපයීමට සියයට 50 ක අත්තිකාරම් මුදලක් ලෙස, රු.246,675 ක් 2015 ජූනි 23 දින ගෙවීම් වවුචරයක් භාවිතාකර ගෙවීම් කර තිබුණි. මෙම ගෙවීමට අදාළ ලිපිගොණු හා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකල අතර, ඉතිරි සියයට 50 ක ගෙවීම සිදුකල බවට හෝ උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කළ බවට සාක්ෂි විගණනයට හඳුනාගත නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ වෙනත් ආදායම් ගිණුමට බැර නොවූ එකතුව රු.3,302,729 ක් පරිගණකගත ගෙවීම් වවුචර් පත්‍ර 09 ක් හා ඒපී ඉන්වොයිස් පත්‍ර 02 ක් භාවිතාකර අවස්ථා 11 කදී වෙනත් ආදායම් ගිණුමට හර කර තිබුණි. සැප් (SAP) පරිගණක වැඩසටහන හරහා ගිණුම්ගත කර තිබූ මෙම හර කිරීම් සඳහා වූ විස්තර හා පැහැදිලි කිරීම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී එහි සත්‍ය හා සාධාරණ බව පිළිගැනීමට නොහැකි වූ අතර, මෙම හර කිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට වෙනත් ආදායම් ගිණුමේ රු.1,353,596 ක අසාමාන්‍ය හර ශේෂයක් ඇති වී තිබුණි.

2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂය තුළ අංක රහිත ජර්නල් සටහනක් භාවිතාකර එකතුව රු.517,380 ක් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගිණුම හර කර. ව්‍යාපාර ප්‍රවර්ධන වැය ගිණුම බැර කර තිබුණි. ලිඛිත අනුමැතියක් රහිත මෙම ජර්නල් සටහන සඳහා ලිඛිත පැහැදිලි කිරීම් කිසිවක් ඉදිරිපත් නොකල අතර, සැප් (SAP) පරිගණක මෘදුකාංගය මඟින් එය ගිණුම්ගත කර තිබුණි.

2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.14,251,257 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු වූ ණය ශේෂවල එකතුව රු.4,838,417 ක් ද, වසර 1 සිට වසර 2 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.1,430,131 ක් ද, වසර 2 සිට වසර 3 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.5,313,594 ක් ද, වසර 3 හා ඊට වැඩි පැරණි ණය ශේෂවල එකතුව රු.2,669,115 ක් වූ අතර, මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.323,914,121 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු වූ ණය ශේෂවල එකතුව රු.190,279,816 ක් ද. වසර 1 සිට වසර 2 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.72,309,032 ක් ද, වසර 2 සිට වසර 3 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.55,124,151 ක් වසර 3 හා ඊට වැඩි පැරණි ණය ශේෂවල එකතුව රු.6,201,122 ක් ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 සහ 16 වන වගන්ති	2006 සිට 2012 දක්වා කාලයට අදාළව එකතුව රු.11,412,950 ක් වූ අර්ථ සාධක අරමුදලේ දායක මුදල් ගෙවා නොතිබුණි.
ආ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 40 වගන්තියේ අංක 05	අධ්‍යක්ෂ මණ්ඩලය යටත් පිරිසෙන් මාස 02 කට වරක් රැස්විය යුතු වුවත්, 2015 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් 16 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 371	මාණ්ඩලික නිලධාරියෙකුට අත්තිකාරම් ලෙස ගෙවිය හැකි උපරිම අත්තිකාරම් සීමාව රු.20,000 ක් වුවත්, නිලධාරියෙකු වෙත අවස්ථා 06 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.2,151,140 ක් 2015 ජූනි 30 දක්වා අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 387	රාජ්‍ය ආයතනය බැංකු අයිරා ලබා ගැනීම් නොකල යුතු වුවත්, 2015 දෙසැම්බර් 31 දිනට රු.5,616,061 ක් බැංකු අයිරා ලෙස ලබාගෙන තිබුණි.

(ඇ) 2006 ජනවාරි 25 දිනැති පාප්‍රනි/08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 1.3.2 වගන්තිය	මණ්ඩලය වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ii) 2.14.1 වගන්තිය සහ අතිරේක අංක 28	2015 අවුරුදු උත්සවය වෙනුවෙන් අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයකට රු.1,270,176 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

4.2.6 වගන්තිය.	කාර්යසාධන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30 ඉකුත් වීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 2 වගන්තිය	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට වාර්ෂික ප්‍රචාරක වැඩසටහනක් ඇතුළත් කර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.5,225,190 ක් ප්‍රචාරණ හා ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

(ii) 6 (iii) වගන්තිය	අනුග්‍රාහක වැය (Sponsorship) සඳහා රු.100,000 සීමාව ඉක්මවන අවස්ථාවලදී මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අවස්ථා 03 කදී එකතුව රු.865,000 ක අනුග්‍රාහක වියදම් දරා තිබුණි.
(ඇ) 2012 දෙසැම්බර් 21 දිනැති අංක ඩීඑම්එස්/G3/60/2 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය	ප්‍රතිව්‍යුහගතකරණය යටතේ අනුමත සියළු තනතුරු සඳහා යෝජිත බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර, ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගත යුතු වුවත්, බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ඈ) 1998 ජූනි 13 දිනැති අංක පීඊ 1/000/6 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය	මණ්ඩලයේ සභාපතිවරයා දරන ලද සංග්‍රහ වියදම් පමණක් ප්‍රතිපූරණය කර ගැනීමට හැකි නමුත්, ඊට පටහැනිව සංග්‍රහ දීමනා ලෙස එකතුව රු.665,000 ක් ගෙවා තිබුණි.
(ඉ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී/58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වගන්තිය	මණ්ඩලයේ සභාපතිවරයාට රු.60,000 ක මාසික දීමනාවක් ගෙවිය යුතු වුවත්, ප්‍රධාන විධායක නිලධාරී ලෙස සලකා 2015 පෙබරවාරි සිට ජූනි දක්වා කාලය තුළ මාසයකට රු.250,000 බැගින් එකතුව රු.1,107,666 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.21,838,265 ක අලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.7,302,990 ක ශුද්ධ ලාභයක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.29,141,255 ක පිරිහීමක් දක්නට ලැබුණි. 2014 වර්ෂයට සාපේක්ෂව විකුණුම් අඩුවීම, විකුණුම් පිරිවැය වැඩිවීම, වෙනත් ආදායම් අඩුවීම සහ පූර්ව වර්ෂවල ඉදිරියට ගෙන එන ලද අයහාර වියදම් ගැළපීම් කිරීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩ ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී අලාභයක් ලබා තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී හස්ත කර්මාන්ත මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂයේදී රු.103,931,453 ක් වූ අතර, එය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.114,041,422 ක් වී තිබුණි.

3.2 කාරක ප්‍රාග්ධන අනුපාත

2014 වර්ෂයේදී 0.36 ක් වූ ක්ෂණික වත්කම් අනුපාතය 2015 වර්ෂය වන විට 0.27 දක්වා පූර්ව වර්ෂයට සාපේක්ෂව සියයට 25 කින් පහත වැටී තිබුණි. මෙම ක්ෂණික වත්කම් අනුපාතය පහත වැටීම අහිතකර තත්ත්වයක් නිරූපණය වූ අතර, එම අනුපාතය පහළ යෑම සඳහා මණ්ඩලයේ ජංගම වත්කම් වලින් සියයට 77.3 ක වෙළඳ භාණ්ඩ තොගයක් පැවතීම හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීම හා ඒවායේ තත්ත්වය දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම, හස්ත කර්මාන්ත භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ සහ විදේශවල විකිණීම සහ අලෙවි කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පත් කර ගැනීමෙහිලා අවශ්‍යයයි මණ්ඩලයේ මතය වනු ලබන සියලු ක්‍රියා කිරීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වේ.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්ගෙන් නිෂ්පාදිත භාණ්ඩ මිලදී ගැනීම 2013 වර්ෂයෙන් පසු අඩුවීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ අතර, 2014 වර්ෂයේදී රු.379,275,627 ක් වූ මිලදී ගැනීම 2015 වර්ෂයේදී රු.324,042,365 ක් වූයෙන් 2015 වර්ෂයේදී දේශීය නිෂ්පාදන මිලදී ගැනීම සියයට 14.56 කින් අඩුවී තිබුණි.

(ආ) දේශීය වෙළඳපොලෙහි හස්ත කර්මාන්ත භාණ්ඩ අලෙවිය පරීක්ෂා කිරීමේදී 2014 වර්ෂයේදී රු.824,873,049 ක් වූ අලෙවි වටිනාකම 2015 වර්ෂයේදී රු.789,304,749 ක් දක්වා රු.35,568,300 කින් අඩුවී තිබූ අතර, විදේශීය වෙළඳපොලෙහි අලෙවියෙහි සුළු වර්ධනයක් පැවතියද, විදේශීය වෙළඳපොලට යොමු වීමේ ප්‍රවණතාව ඉතා අඩු මට්ටමක පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේදී රු.20,447,738 ක් වැය කර, සිසුන් 80 කට නේවාසික පහසුකම් සැපයිය හැකි වර්ග අඩි 4680 ක් වූ තෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් කටුබැද්ද වඩු කාර්මික පුහුණු අංශ භූමියේ ඉදිකරමින් තිබුණද, එම ගොඩනැගිල්ලේ වහලය ඉදිකිරීමකින් තොරව ඉදිකිරීම 2008 වර්ෂයේ සිට නවතා දමා තිබීම හේතුවෙන් ගොඩනැගිල්ලේ බිත්ති පුපුරා ගොස් ගොඩනැගිල්ල විනාශයට ලක්වී තිබුණි. මෙම ගොඩනැගිල්ල ආරක්ෂා කිරීමට සහ ඵලදායී කාර්යයකට යෙදවීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් විකුණුම් කටයුතු සහ භාණ්ඩ තොග වාර්තා තබා ගැනීම සඳහා පොස් Point of Sales (POS) නැමති තවත් පරිගණක මෘදුකාංගයක් භාවිතා කර තිබුණි. විකුණුම් සහ වෙළඳ භාණ්ඩ තොගය පිළිබඳව තොරතුරු පොස් මගින් සැප් System Applications & Products (SAP) මෘදුකාංගයට මාරු කිරීමේදී අඩුපාඩු සහිතව එම මාරුවීම් සිදුවන අතර, මෙම හේතුව මත නෙගටිව් බිල් පත්‍ර (Negative Bill) ඇති වී තිබුණි. ඒ අනුව පරිගණක ලෙජරය අනුව තොගය සහ භෞතික ඉතිරි තොගය අතර, නිරවුල් නොකල වෙනස්කම් පැවති අතර ප්‍රදර්ශනාගාරවල තොග ශේෂ නිවැරදි කිරීමට කළමනාකරණයේ අවධානය යොමුව නොතිබුණි.

12

(ඇ) 2012 නොවැම්බර් 18 දිනැති අංක 12/1523/553/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, ගාල්ල උණවටුන ඉදිකර තිබූ සී/ස ලංකා සළුසල ගාල්ල ශාඛාවට අයත් ඉඩම සහ ගොඩනැගිල්ල ලක්සල වෙත නීත්‍යානුකූලව පැවරීමට නිර්දේශ කර තිබුණි.ඒ අනුව එම දේපළ මිලදී ගැනීම සඳහා ගැණුම් ප්‍රතිෂ්ඨාව වශයෙන් 2012 දෙසැම්බර් 12 දින රු.15,248,575 ක් ගෙවා වසර 3 ක කාලයක් ගතවී තිබුණද මෙම ඉඩම සහ ගොඩනැගිල්ල ලක්සල වෙත නීත්‍යානුකූලවී පවරා ගැනීමට කටයුතු ක්‍ර නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු කොටුව ලක්සල ගොඩනැගිල්ල සහ ඉඩම රාජ්‍ය බැංකුවකට උකස් කර 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ අවස්ථා 10 කදී එකතුව රු.749,481,500 ක ණය මුදලක් ලබාගෙන තිබූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂය රු.265,570,182 ක් විය. එම ණය මුදලින් කොටුව ලක්සල ගොඩනැගිල්ල නවීකරණය, අපේ ගම පරිශ්‍රයේ ඉදිකිරීම්, විවිධ විදේශ සංචාර, පූර්ව වර්ෂ ණය වාරික හා පොළී ගෙවීම් සහ ආයතනයේ මෙහෙයුම් හා පරිපාලන වියදම් සඳහා ගෙවීම් සිදුකර තිබුණි. ආයතනයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය නිසා ඉහත පරිදි අඛණ්ඩව ණය ලබා ගැනීමට සිදුවී ඇති අතර, එසේ ලබාගනු ලැබූ ණය මුදල් ඵලදායී ආයෝජන කාර්යයක යෙදවීමක් සිදු කර නොතිබුණි. තවද, කොටුව ලක්සල ඉදිකිරීම්, අපේගම ඉදිකිරීම් සහ ලක්සල ප්‍රදර්ශනාගාර කිහිපයක කටයුතු වර්තමානය වන විට සම්පූර්ණයෙන් අතහැර දමා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් පදනමට බඳවා ගන්නා ලද කළමනාකරුවන් 12 දෙනෙකු මණ්ඩලය විසින් ක්‍රියාත්මක ප්‍රදර්ශනාගාර 14 න් 12 ක සේවයේ නියුතුව තිබූ අතර, ගබඩා භාරකරුවන් සහ තවත් විවිධ තනතුරුවලටද කොන්ත්‍රාත් සේවකයන් සේවයේ යොදවා තිබුණි. භෞතික සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පිරිවැය රු.24,383,988 ක තොග ඌනතාවයක් වර්ෂය අවසාන දිනට නිරීක්ෂණය වූ අතර, ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය සඳහා කොන්ත්‍රාත් පදනමට සේවකයන් සේවයේ යෙදවීම හේතුවෙන් තොගයේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානමක් පැවතුණි.

(ඇ) කොළඹ කොටුව ලක්සල ප්‍රදර්ශනාගාරයේ නවීකරණ කටයුතු හේතුවෙන් ප්‍රදර්ශනාගාරය කලින් පැවති ප්‍රමාණයෙන් හතරෙන් එකකට සීමා වී ඇති අතර, එහි අලෙවිය 2014 වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ දී රු.11,839,992 කින් පහත වැටී තිබුණි. විකුණුම් ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2013 පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවට සමගාමීව ආරම්භ කළ අපේ ගම ව්‍යාපෘතිය 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට අපේගම ව්‍යාපෘතියෙන් ලැබෙන සියළු දෛනික ආදායම් අධ්‍යාපන අමාත්‍යාංශයට ලක්සල විසින් ලබාදී 2016 දෙසැම්බර් වන විට වසරක කාලයක් ගතවී තිබුණද අපේගම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම් ලක්සල වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි

4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පානදුර කෙසෙල්වත්ත, ලුහු ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ රු.3,988,500 ක් වටිනා ලුහු ඉංජිනේරු එක් අවුරුදු පුහුණු පාඨමාලාව සඳහා එකවර සිසුන් 30 ක් පුහුණු කල හැකි දේශන ශාලා සහිත ගොඩනැගිලි, පර්චස් 40ක පමණ ඉඩම, ලේත් මැෂින් ඇතුළු ලුහු ඉංජිනේරු පුහුණු උපකරණ 2010 වර්ෂයේ සිට වසර 06 කට අධික කාලයක් පුහුණු කිරීම් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) කටුබැද්ද ගාළු පාර අංක 282 හි පිහිටි, අක්කර 2 පර්චස් 24.9 ක් වූ ඉඩම, වර්ග අඩි 11,200 ක් වූ එකවර සිසුන් 80 ක් පුහුණු කළ හැකි වඩු පුහුණු කර්මාන්තශාලාව සහ එහි සවි කරන ලද යන්ත්‍රෝපකරණ, ඉගැන්වීමේ උපකරණ, වර්ග අඩි 2090 ක දැව ගබඩාව සහ ද්විත්ව ඇඳන් 40 කින් යුතු වර්ග අඩි 4680 ක් වූ දෙමහල් නේවාසිකාගාරය 2011 වර්ෂයේ සිට වඩු කාර්මිකයින් පුහුණු කිරීමේ කටයුතු නවතා දැමීම හේතුවෙන් වසර 05 කට අධික කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි.

(ඇ) 2015 වර්ෂය තුළ වාගොල්ල, වැලිපැන්න 2 ප්‍රදර්ශනාගාර වසා දැමීම, භාණ්ඩ දූර්වර්ණ වීම සහ විවිධ අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතා හේතුවෙන් එකතුව රු.3,890,800 ක චලනය නොවන භාණ්ඩ තොගයක් කටුබැද්ද ව්‍යාපෘතියේ නිෂ්ක්‍රියව ගබඩා කර තිබුණි. අලෙවි කළ නොහැකි තත්ත්වයේ තිබූ මෙම භාණ්ඩ තොගය, වෙළඳ භාණ්ඩ තොගයෙන් ඉවත් කිරීමට හෝ අළුත්වැඩියා කළ හැකි භාණ්ඩ අළුත්වැඩියා කර අලෙවිය සඳහා ප්‍රදර්ශනාගාර වෙත යැවීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය තුළ සේවක අර්ථ සාධක අරමුදල් නිසි පරිදි නොගෙවීම නිසා එකතුව රු.5,706,475 ක අධිභාර මුදලක් 2015 වර්ෂය තුළ ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) පානදුර කෙසෙල්වත්ත, ලුනු ඉංජිනේරු පුහුණු අංශය ඵලදායි කාර්යයක් සඳහා යොදා නොගෙන වසා දමා තිබූ අතර, එහි ආරක්ෂක සහ විදුලි වියදම් ලෙස 2015 වර්ෂය තුළ එකතුව රු.957,512 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) මණ්ඩලය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් 2013 වර්ෂයේදී ලබා ගත් ණය සඳහා පොළී මුදල් නොගෙවීම හේතුවෙන්, බැංකුව විසින් එම ණයපොළී මුදල් ප්‍රාග්ධනිත කර තිබුණි. එම ණයපොළී මුදල් ප්‍රාග්ධනිත කිරීම මත 2015 වර්ෂයේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් දක්වා මාස 04 ක කාලපරිච්ඡේදයකට, සියයට 9.8 ක එනම් රු.453,161 ක අමතර ණය පොළියක් බැංකුව වෙත ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) කටුබැද්ද වඩු කර්මාන්ත ව්‍යාපෘති අංශයේ ගොඩනැගිලි නිෂ්කාර්යව තිබියදී, කාර්යාලය සහ ගබඩාව සඳහා කොළඹ 10, නොරිස් ඇනල් පෙදෙසින් ගොඩනැගිලි 2013 මැයි 15 දින සිට කුළියට ගෙන තිබුණි. එම ගොඩනැගිලි කුලී ලෙස 2015 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.11,148,000 ක් ගෙවීම් කර තිබූ අතර, එහි අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් රු.1,350,493 ක් ගෙවීම් කර තිබුණි.

4.7 හඳුනාගන්නා ලද පාඩු

ආයතනයේ අරමුණු හා පරමාර්ථවලට පටහැනිව ගුවන් විදුලි සංස්ථාවේ ඇන්ටනා කුළුණක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් 2011 සැප්තැම්බර් 07 දින මණ්ඩලය විසින් භාරගෙන තිබූ අතර, එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකිරීම මත 2014, 2015.වර්ෂ දෙක තුළ එකතුව රු.4,348,041 ක් ගුවන් විදුලි සංස්ථාව වෙත ගෙවීම් කර තිබුණි. එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මණ්ඩලය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබූ අතර, නිසි පරිදි කොන්ත්‍රාත්තුව ඉටු නොකිරීම නිසා ගෙවීමට සිදු වූ අලාභය කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලය 127 ක් සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 67 ක් ඇතුළුව අනුමත සේවක සංඛ්‍යාව 194 ක් විය. වර්තමානය වන විට ස්ථිර සේවකයින් 40 ක් පුරප්පාඩුව පැවති අතර, කොන්ත්‍රාත් පදනම මත වූ සේවකයින් 34 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු වලට පරිබාහිරව, අනුමත නොවූ තනතුරු 14 ක් සඳහා සේවකයින් 28 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) මණ්ඩලය සඳහා කොන්ත්‍රාත් පදනම මත උපදේශක තනතුරු 04 ක් පමණක් අනුමත කර තිබුණද, එම අනුමත උපදේශක තනතුරු වලට අමතරව උපදේශක තනතුරු 03 ක් වෙනුවෙන් බඳවා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.4,850,000 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

4.9 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

කොළඹ කොටුව ලක්සල ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය පවතින ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සඳහා 2013 ජනවාරි මාසයේදී රු.136,815,008 ක් ඇස්තමේන්තු කර කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2011 ජනවාරි 01 දිනැති අතිරේක 20 හි 3.2 වගන්තිය පරිදි විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණය මත කොන්ත්‍රාත්කරුවකු තෝරාගත යුතු වුවද, ඊට පටහැනි අයුරින් කිසිදු සාධාරණ හේතු දැක්වීමකින් තොරව කොන්ත්‍රාත්තුව කොටස් 04කට බෙදා වෙන්කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණ මත එකම කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක 20 හි 2.8.1 (අ) වගන්තියට පටහැනිව කොටුව ලක්සල නවීකරණ කොන්ත්‍රාත්තුවේදී ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ යන කමිටු දෙකෙහිම එකම නිලධාරීන් සාමාජිකයින් ලෙස කටයුතු කර තිබූ අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා විෂයය පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකු පත් කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය පරිදි අත්තිකාරම් ගෙවීම සඳහා සුරක්ෂණයක් ලබා නොගෙන කොටස් 04 සඳහා රු.25,589,959 ක් ගෙවීම් කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබීම හේතුවෙන් ගෙවන ලද මුදල් අයකර ගැනීමට ද නොහැකි වී තිබුණි.

(ඉ) කොටස් 04 හි නවීකරණය කටයුතු සඳහා එකතුව රු.43,751,409 ක් ගෙවීම් කර තිබුණ ද නවීකරණය කටයුතු අවසන් නොකර 2014 සැප්තැම්බර් මාසයේ සිට කොන්ත්‍රාත්කරු විසින් නවීකරණය කටයුතු අතහැර දමා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 ඔක්තෝබර් 10 දින දීය.

5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව, අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවත්, 2015 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව, 2015 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2014 වාර්ෂික වාර්තාව 2016 දෙසැම්බර් 31 දින දක්වා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

5.7 නොවිසඳී ඇති විගණන ඡේද

2014 වාර්තාවෙන්ද පෙන්වා දුන් පරිදි 2006 පෙබරවාරි 01 දිනැති අංක 06/021/234/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් හා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය පිහිටුවන ලද 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතින් බලය නොපවරන ලද කාර්යයන් සඳහා 2014 වර්ෂය දක්වා රු. මිලියන 340.5 ක් වැය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ගුවන් විදුලි සංස්ථාවේ ඇන්ටනා කුළුණක් ඉදිකිරීමට ඇති කර ගත් ගිවිසුමක් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා, රු.2,848,041 ක් ගුවන් විදුලි සංස්ථාවට ගෙවීමට සිදු වී තිබුණි.

මෙසේ මතභේදයට තුඩුදුන් අරමුණු හා කාර්යයන්ට පටහැනි කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

	සේවා ආයතනය	මතභේදයට තුඩුදුන් කාර්යය
(i)	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව	වැලිකඩ ළමා උද්‍යානයේ සහ නගර සභා පරිශ්‍රය තුළ සූර්ය බල ශක්තියෙන් ක්‍රියා කරන විදුලි ආලෝක පද්ධති 20 ක් සවි කිරීම.
(ii)	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	විකාශන කුළුණක් ඉදි කිරීම.
(iii)	අධිකරණ අමාත්‍යාංශය	ජාත්‍යන්තර බේරුම් කිරීමේ මධ්‍යස්ථානය නවීකරණය

. ලක්සල තුළ ඉංජිනේරු ඒකකයක් පිහිටුවීම හා අභ්‍යන්තර හා බාහිර කොන්ත්‍රාත් මණ්ඩලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පැවරීම සහ ඒවා නිසි පරිදි ඉටු නොකිරීම නිසා, සමාලෝචිත වර්ෂය වන විටත්, අධිකරණ ක්‍රියාමාර්ගයන්ට මුහුණ පෑමට සහ විවිධ වන්දි ගෙවීමට ලක්සලට සිදු වී තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) මූල්‍ය පාලනය	ආයතනය විධිමත් පාලනයකට යටත්ව ජර්නල් සටහන් නොයෙදීම, අංක රහිත ජර්නල් සටහන් යෙදීම, ලිඛිත අනුමැතිය රහිතව ජර්නල් සටහන් ගිණුම්ගත කිරීම සහ ගනුදෙනු ගිණුම්ගත නොකිරීමත්, පරිගණකගත ගිණුම් ක්‍රමය මඟින් ශේෂ පිරික්සුම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම.
(ආ) ගබඩා පාලනය	භෞතික තොග ගණන් ගැනීම සඳහා මාස 06 ක කාලයක් ගැනීම, වර්ෂ අවසාන දිනට තොගයට කළ යුතු ගැලපීම් එකිනෙක භාණ්ඩ පදනමින් සිදු නොකිරීම.
(ඇ) තොග පාලනය	ප්‍රදර්ශනාගාරවල අලෙවියට තබා ඇති භාණ්ඩ අලෙවි නොවී දීර්ඝ කාලයක් පවතින බව නිරීක්ෂණය වූ අතර, ඇතැම් භාණ්ඩ අලෙවි කල නොහැකි තත්වයට පත්ව ප්‍රදර්ශනාගාරවලින් ඉවත් කර යලි නවීකරණය කිරීමට සිදුවී තිබීම.
(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය	ආයතනයේ කාර්ය මණ්ඩලයෙන් සියයට 60 ක ප්‍රතිශතයක් කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබූ අතර, අනුමත කාර්ය මණ්ඩලය ආයතනයේ කාලීන අවශ්‍යතාව මත යාවත්කාලීන කරගෙන නොතිබීම.

(ඉ) අලෙවි කළමනාකරණය	හස්ත කර්මාන්ත නිෂ්පාදන දේශීය වෙළඳපොල තුළ අලෙවිය දිගුකාලීනව පහත වැටී තිබූ අතර. විදේශීය අලෙවිය පිළිබඳව ආයතනය ඉතා අඩු අවධානයක් යොමුකර තිබීම.
(ඊ) මුදල් පොත් පවත්වා ගැනීම	ලිඛිතව මුදල් පොත් පවත්වා නොගැනීම, ගෙවීම් වලට අදාළ ප්‍රතිවිරුද්ධ ලෙජර් ගිණුම් මුදල් පොතේ සටහන් නොකිරීම සහ වවුචර් අංක අනුපිළිවෙලින් සටහන් නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති